**සිංහල පරිවර්තනය**

## උතුරු පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් තනතුරට පුරප්පාඩු පිරවීම - 2023

උතුරු පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුවී තිබෙන උතුරු පළාත් ආදායම් බදු කොමසාරිස් තනතුරට(තනතුරු සංඛ්‍යාව 01) මේ වනවිට සේවයේ නියුක්තවී සිටින (අයදුම්පත් කැඳවන අවසාන දිනට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම නොගැන්වූ) ශ්‍රී ලංකා දේශීය ආදායම් බදු සේවයේ සුදුසුකම්ලත් නිලධරයන් ගෙන් හා පළාත් ආදායම් බදු සේවයට බැඳි නිලධරයන් ගෙන් ද අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2023.05.22 වේ.

උතුරු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක NP/02/01/RS/01 හා 2023.04.10වන දින දරණ නිර්දේශයට අනුකූලව, උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවරයාගේ 2023.04.07 වන දින දරණ අනුමැතියට අනුකූලව ද 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද පළාත් ආදායම් බදු සේවයේ විධායක සේවා ශ්‍රේණියට අයත් තනතුරට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය මඟින් පනවා ඇති කොන්දේසීන් හා ආයතන සංග්‍රහය මඟින් සළසා ඇති විධිවිධානයන්ට ද මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 වන දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයට අදාළ ආයතන කාර්ය පටිපාටියට අනුකූලව සුදුසුකම් සපුරා ඇති නිලධරයකු තෝරා පත් කරනු ලැබේ

**02. බඳවා ගැනීමේ සේවා කොන්දේසීන් :-**

2.1. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. උතුරු පළාත් ආදායම් බදු සේවයේ මෙම තනතුර සඳහා අනුමත සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ රීතීන්ට අනුකූලව මෙම සේවා කොන්දේසීන් අදාළ වනු ඇත.

2.2 මෙම තනතුරට පත්වන නිලධරයා උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ඉදිරිපත් විය යුතුයි.

2.3 ඉහත තනතුරට අයදුම් කරන අපේක්ෂකයන් තම අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් යොමු කළ යුතුයි.

**03. වැටුප් පරිමාණය :-**

2016/02/25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 පරිදි **SL 1 – 2016** යන වැටුප් පන්තිය යටතේ **රුපියල් 47,615 – 10 x 1,335 – 8 x 1,630 – 17 x 2,170 – රුපියල්. 110,895/-** වේ.

04. **සුදුසුකම්** :-

4.1 මේ වනවිට සේවයේ නියුක්තව සිටින නිලධරයන්ගේ බඳවා ගැනීමක් නිසා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

4.2 ශ්‍රී ලංකා ස්වදේශීය ආදායම් බදු සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් හෝ නියෝජ්‍ය කොමසාරිස් තනතුරේ වසර පහක්(5) සම්පූර්ණ කර ඇති හෝ ඉහත සුදුසුකම් සපුරා ඇති ඕනෑම පළාතකින් ආදායම් බදු සේවයට අයත් නිලධරයන් තෝරා පත් කරන විට සම්පූර්ණ කාලය පදනම් කරගෙන සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුකූලව නිදහස් විය යුතුයි.

4.3 අයදුම්කරුවන් නියමිත ශ්‍රේණියේ 2023.05.22 දිනට පෙරාතුව වසර 05ක කාර්යක්ෂමත් ලෙස හා තෘප්තිමත් සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර එම කාලය තුළදී උපයාගත යුතු වැටුප් වර්ධකයන් සියල්ල උපයා තිබිය යුතු අතර විනයානුකූල අඩුවමකට යටත් නොවී සිටිය යුතුයි.

05. **සාමාන්‍ය සුදුසුකම් :-**

අයදුම්කරුවන් කැඳවා ඇති තනතුරේ රාජකාරීන් ඉටු කිරීමට අවශ්‍ය ශාරීරිකව හා මානසිකව නිරෝගී විය යුතුයි.

**06. බඳවා ගැනීමේ ක්‍රමය :-**

නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා දේශීය ආදායම් බදු සේවයට අයත් හා පළාත් ආදායම් බදු සේවයට අයත් අයදුම්කරුවන්ට උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා උපරිම ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ මත සුදුසුකම් ලබන අයදුම්කරු මෙම තනතුරට තෝරා පත් කරනු ලැබේ.

6.1. උතුරු පළාතේ පළාත් ආදායම් බදු කොමසාරිස් තනතුරට අනුමත කර ක්‍රියාත්මක වෙමින් පවතින සේවා ව්‍යාවස්ථා සංග්‍රහය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, ආයතන සංග්‍රහය, පළාත් ප්‍රතිපත්තීන් හා නිවේදනයේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව බඳවා ගැනීමේ කටයුතු සිදු කරනු ලැබේ. ඒ සමඟම අයදුම්කරුවන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර මෙම නිවේදනය මඟින් කැඳවා ඇති සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් සපුරා නැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අහෝසි කරනු ලැබේ.

6.2. පළාත් ආදායම් බදු කොමසාරිස් තනතුරට අනුමත සේවක සංඛ්‍යාවෙ 2023.05.22 දිනට පවතින පුරප්පාඩුවට (01) පත් කරනු ලැබේ.

6.3. සියළුම අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2023.05.22) ප්‍රථම තනතුරට අදාළවූ සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුයි, එමෙන්ම තොතුරු සම්පුර්ණයෙන් සපයා නැති හා සුදුසුකම් සපුරා නැති නිලධරයන්ගේ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.4 ඔබගේ සුදුසුකම් සනාථ කෙරෙන සියළුම ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට ඉදිරිපත් කළ යුතුයි. සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීමට අපෙහොසත් වන ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණයෙන් පසු ඉදිරිපත් කිරීමේදී කුමණ කාරණාවක් හේතු කොට ගෙනවත් සැළකිල්ලට ගනු නොලැබේ.

**07. අසත්‍ය තොරතුරු සඳහා වූ දඬුවම :-**

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතාමත්ම අවධානයකින් යුතුව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුයි. (මෙම ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයේ රීතීන් ප්‍රකාරව,) අයදුම්කරුවෙකු විසින් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයට ප්‍රථමයෙන් හෝ ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන විට හෝ පසුව හෝ සුදුසුකම් සපුරා නැති බව එළිදරව් වන්නේ නම් අපේක්ෂත්වය සඳහා වූ හිමිකම් අහෝසි කරනු ලැබේ. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය තොරතුරු බවට එළිදරව් වන ඕනෑම අවස්ථාවකදී එම නිලධරයා රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබේ

**08. අයදුම් කළ යුතු ක්‍රමය :-**

8.1. මෙම නිවේදනය සමඟ අමුණා ඇති අයදුම්පත්‍රය තම අත් අකුරු වලින් සම්පූර්ණ කර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් යොමු කළ යුතුයි.

8.2. අමුණා ඇති අයදුම්පත්‍රයට අනුකූල නොවන නිවැරදි ආකාරයට සම්පූර්ණ කර නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ නිසා ඇතිවන බලපෑම් කෙරෙහි අයදුම්කරුම වගවිය යුතුයි අයදුම්පත්‍රයේ පිටපතක් තමන් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි අතරම ඉදිරිපත් කරන අයදුම්පත්‍රය නිවේදනය සමඟ අමුණා ඇති අයදුම්පත්‍රයට සමාන බව අයදුම්කරු විසින්ම වගවිය යුතුයි. ඒ පරිදි සකස් කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3. අයදුම්පත් යොමු කරන ලිපිකවරයේ වම් උඩු කෙළවරේ “**පළාත් ආදායම් බදු කොමසාරිස්, තනතුරු පුරප්පාඩු පිරවීම්** – 2023” යනුවෙන් සඳහන් කර යොමු කළ යුතුයි.

8.4. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2023.05.22වන** දිනට හෝ ඊට ප්‍රථම යොමු වන පරිදි ලියාපදිංචි තැපැල මගින් “ලේකම්, **රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය.**” යන ලිපිනයට යොමු කළ යුතුයි. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගන්නේ නැත.

09. අයදුම්කරුගේ අනන්‍යතාව සනාථ කිරීමට පහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම් පත

(ii) වලංගු ශ්‍රී ලංකා ගුවන් ගමන් බලපත්‍රය

(iii) වලංගු රියදුරු බලපත්‍රය

**10. ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය :-**

ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් විෂයයන්ට ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

- **(සම්පූර්ණ ලකුණු ප්‍රමාණය 100)**

| අංක | ලකුණු ප්‍රදානය කෙරෙන විෂය පථයන් | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| **01.** | **සේවා ජ්‍යෝෂ්ඨතාවය** | |
| 01.1 | පළාත් ආදායම් බදු සේවයේ හෝ ශ්‍රී ලංකා දේශීය ආදායම් බදු සේවයට බැඳුණු I ශ්‍රේණියේ සතුටුදායක හා සක්‍රීය සේවා කාලය පිරිනමන ලද එක් එක් වර්ෂයක් සඳහා ලකුණු 5 බැගින් පිරිනැමේ | 50 |
| 01.2 | පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ හෝ ශ්‍රී ලංකා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් තනතුරේ හෝ ඊට ඉහළ උසස් තනතුරේ සතුටුදායක හා සක්‍රිය සේවා ප්‍රදානය සඳහා එක් එක් වර්ෂය සඳහා ලකුණු 2 යි. | 10 |
| **02.** | **වෘත්තීය සුදුසුකම්** | |
| 02.1 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් ඩිප්ලෝමා සහතිකපත් ප්‍රදානය කරන ආයතනයකින් බදු කළමනාකරණය නීතිවිද්‍යාව හෝ වානිජ විෂයයන් සඳහා ලබාගත් පශ්චාත් ඩිප්ලෝමා සඳහා ලකුණු 04 යි | 08 |
| 02.2 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අනුමැතිය ලත් විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමැතිය ප්‍රදානය කළ උපාධි ප්‍රදාන ආයතනයක බදු කළමානකරණ නීතිමය වානිජ පරිපාලනය ආර්ථික වානිජ ගිණුම්කරණය හෝ රාජ්‍ය පරිපාලන සම්බන්ධ විෂයයන් ගෙන් ලබාගත් පශ්චාත් උපාධිය, එක් පශ්චාත් උපධියක් සඳහා ලකුණු 06 (පශ්චාත් ඩිප්ලෝමා, හා පශ්චාත් උපාධිය එකම විෂයයක් සඳහා ලබා ගෙන තිබේ නම් පශ්චාත් උපාධිය සඳහා ලකුණු පිරිනැමේ) | 12 |
| **03** | ජාතික සම්මාන, විශේෂ ව්‍යාපෘතීන්, ලිපි පළ කිරීම හෝ පළාත් ආදායම් බදු නීතිය හා ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් පළ කරන ලද පොත් මෙම ක්‍රියාකාරකම් වලින් එක් ක්‍රියාකාරකමක් සඳහා ලකුණු 05 යි | 10 |
| **04** | **සම්මුඛ පරීක්ෂණයේදී** | . |
| 04.1 | නායකත්වය | 02 |
| 04.2 | සන්නිවේදන හැකියාව | 02 |
| 04.3 | ආත්ම විශ්වාසය | 02 |
| 04.4 | විශ්ලේෂණාත්මක චින්තනය | 02 |
| 04.5 | වෘත්තීය අනුග්‍රහය | 02 |
| | **සම්පූර්ණ ලකුණු ප්‍රමාණය** | **ලකුණු 100** |

11. **සැළකිය යුතුයි** : මෙම නිවේදනයේ දෙමළ හා සිංහල භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පැන නගින අවස්ථාවකදී දෙමළ භාෂා මාධ්‍යයට ප්‍රමුඛත්වය පිරිනැමෙන අතර මෙම නිවේදනය මගින් විධිවිධාන යොදා නැති කුමණ කරුණක් සඳහා වුව ද උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ තීරණය අවසන් තීරණය වේ. එමෙන්ම, මෙම කාරණාවේ දී පැහැදිලි කරගත යුතු යමක් තිබේද ඒ සඳහා උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ 021 - 221 9980 යන දුරකථන අංකයට අමතන්න

***සි. තිරුවාකරන්,***
**ලේකම්,**
**රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**උතුරු පළාත.**
2023.05.03